සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

10 ශ්‍රේණිය | **සිංහල සාහිත්‍ය රසාස්වාදය** | **කාලය පැය 03 යි**

නම/ විභාග අංකය:

- මෙම ප්‍රශ්න පත්‍රය **I** පත්‍රය හා **II** පත්‍රය යන කොටස් දෙකකින් සමන්විත ය.

I - පත්‍රය

- **I** පත්‍රයේ ඇති ප්‍රශ්න දෙක සඳහා ප්‍රශ්න පත්‍රයේ ම උත්තර සපයා වෙනම භාරදෙන්න.

(01) (i) සිට (v) දක්වා ඇති කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) ''බලග මා කළ දෙයක මම් මාගේ දියණියකැයි සිතා පහරක් ගැසිමි''

(අ) මෙසේ පහරක් ගැසුවේ කවුද?

.....

(ආ) මෙහි එන ''මාගේ දියණිය'' යනු කවුද?

.....

(ii) නපුරු කලට සතහට පැමණෙන වෙහෙස
එදුරු නොවෙයි කළ පව් පල දෙවා මිස

(අ) මෙහි ඉතිරි පද පේලි දෙක සම්පූර්ණ කරන්න.

.....

(ආ) මෙම පද්‍ය ඇතුළත් කෘතිය රචනා වූ යුගය කුමක් ද?

.....

(iii) ''ජීවත් ව උනිමි නම් සැපසේ අවුත් දකින්නෙමි වේදැයි''

(අ) මෙම ප්‍රකාශය කළේ කවුද?

.....

(ආ) එසේ ප්‍රකාශ කළේ කාටද?

.....

(iv) ''අපේ කුඩුව තරම් ලස්සන කුඩුවක් වෙන කොහොවත් නෑ නේද අයියේ''

(අ) මේ ප්‍රකාශය උපුටාගත් කෙටිකතාව කුමක් ද?

.....

(ආ) එම කෙටි කතාව රචනා කළ කතුවරයාගේ නම ලියන්න.

.....

(v) ඉරට ඉරක් නැත මෙහෙම ඉරක් නැත ඉරිදා පායන ඉර වාගේ
සඳට සඳක් නැත මෙහෙම සඳක් නැත සඳුදා පායන සඳ වාගේ

(අ) මෙය කුමන ජනකවි වර්ගයකට අයත් ද?

.....

(ආ) ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

.....

(මුළු ලකුණු 4 × 5 = 20)

Past Papers Wiki

- පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකින් **එක** කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

(02) එකෙණෙහි ප්‍රභවති තොමෝ පස් පියුමෙන් ගැවසිගත් පොකුණ දැක නහනු කැමතිව පිරිවර හා සමඟ පොකුණට බැස කෙළිමින් මහබෝධිසත්වයන් මුණ වසාගෙන සිටි පියුමට අත දික් කළාය. එකල්හි රජ්ජුරුවෝ නෙලුම්පත ඉවත් කොට ''මම කුස රජයයි ප්‍රභාවතින් අත ඇල්ලුය. ඔහුගේ මුඛය දැක ''යක්ෂයෙක් මා අත අල්වා ගතැයි මුරගාමින් භයින් ගියාය. එසඳ රජ්ජුරුවෝ අත ඇරපීහ. ඉක්බිති බිසෝ සිහි ලදින් සිතන්නාහු ''මා අත ඇල්ලුවෝ ඉදින් කුස රජ්ජුරුවෝ වී නම් ඇත්හල දී ඉලන්තියෙනුත් අස්සල දී අස් බෙටියෙනුත් මුන් විසින්ම ගසන ලදිමි. ඇතුගේ පශ්චිමාසනයෙහි ද මා වෙහෙසවුවොත් මූ ම ය. මෙසේ විරූප වූ දුර්මුඛ වූ වල්ලභයාගෙන් මට ප්‍රයෝජන කිම්ද, ජීවත්ව උනිමි නම් මට වල්ලභයන් අරුම නොවන්නේය'යි සිතා තමන් හා එක්ව ආ අමාත්‍යයන් යවා ''යාන වාහන සරහව. අද දවසේම නික්මෙමි'යි කිහ.

ඔහු එපවත් රජ්ජුරුවන්ට කීවාහු ය. ඒ අසා රජ්ජුරුවෝ මු යන්ට අවසර නොලද්දු නම් ළය පැළි මිය යන්නාහ. වන්නාට දැනට යෙත්ව'යි, නැවත මාගේ බලයෙන් ගෙන්වා ගනිමි සිතා ගමන් අනුදත්හ. එකල්හි ප්‍රභාවතී පිරිවර හා සමඟ පිය රජ්ජුරුවන්ගේ සාගල නුවරට ම ගියෝ ය. ප්‍රභාවති තොම කුස රජ්ජුරුවන්ට ජාතියේ කළ ප්‍රාර්ථනාවෙන් නොකැමති වුව බෝධි සත්වයෝ ද පූර්වයෙහි කරන ලද අකුසල බලයෙන් විරූපව ගියහ.

(i) කුස රජතුමා යනු විරූපි තැනැත්තෙක් බව, ප්‍රභාවතී තීරණය කිරීමට හේතු 2 ක් ලියන්න. (ලකුණු 4)

.....

.....

(ii) ප්‍රභාවතියට යෑමට අවසර දුන්නේ ඇයි ? (ලකුණු 4)

.....

.....

(iii) මෙම ඡේදයේ චිත්ත රූප මැවෙන අවස්ථා 2 ක් දක්වන්න. (ලකුණු 6)

.....

.....

(iv) මෙම ඡේදයට අනුව ජාතකකතාකරුගේ භාෂාව හැසිරවීමේ දක්ෂතාවය කෙබඳුදැයි පැහැදිලි කරන්න. (ලකුණු 6)

.....

.....

.....

.....

(මුළු ලකුණු 20)

<u>නැතහොත්,</u>

උපන්නෙත් මැරෙන්නෙත් තනියමයි ලොවේ
එයින් පිටස්තර වෙන විදියකින් නොවේ
එයින් එහෙම නම් තම යුතුකම හමුවේ
බියෙන් තැති ගැනුම අප හට තරම් නොවේ

නම්බුව කැමති අය ඇතිනම් නොවී මුලා
ගම්මුන් සැවොම ගම්මුන්ටම එකතු වෙලා
ලොම් සිදුරක තරම්වත් අඬදබර නොළා
පිම්මක් පනිමු ගම්මුන්ගේ ජයම බලා

උපන් ගමේ බල උරුමය රැක ගන්ට
සටන් කෙරුම සතුටක් නම් වැසි යන්ට
බියෙන් නොගොස් අහුමුලුවල රිං ගන්ට
ඉතින් යමව් ගම්මුන්ටම එක් වෙන්ට

වඳින්නේ නැතිව ලොකු නිලධාරින් ට
තමන්ගේ බලය උරුමය රැක ගන් ට
හිතින්වත් කැමති නම් එය කර ගන් ට
ඉතින් අඬ ගසව් තම හිත මිතුරන් ට

ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා
අතත් පයත් ඔළුවත් වෙන වෙනම කපා
කතත් කමක් නැහැ බියසුලු ගතිය පපා
අයුත්කට අත් දෙක ඔසවන්ට එපා

අපේ රට අපේ ජාතිය අපේ ගම
අපේ අසල්වැසියා යන සියල්ල ම
අපේ අතට අවනතකර ගෙන වහම
අපේ නමට සලකත දිවි දෙමු මෙහෙම

මුල බැස තිබෙන ගම්මුන්ගේ සමඟි සැපා
සොලවා මරා වළලන්නට යොදා උපා
කුලමල උගුල් අටවන බොරු බණක් පපා
නිලධාරින්ට විශ්වාසය දෙන්න එපා

(i) මෙහි සඳහන් යුතුකම් 2 ක් දක්වන්න. (ලකුණු 04)

.....

.....

(ii) විශ්වාස තබන්නට එපා යැයි මෙහි සඳහන් කර ඇත්තේ කවුරුන් පිළිබඳව ද? (ලකුණු 04)

.....

.....

.....

.....

.....

(iii) මෙම පද්‍ය පන්තිය තුළින් සමාජයට ලබාදෙන පණිවඩය කුමක් ද? (ලකුණු 06)

.....

.....

.....

.....

.....

.....

.....

(iv) මෙම පද්‍ය පන්තියේ භාෂාව එහි සාර්ථකත්වයට බලපා ඇති ආකාරය පිළිබඳ විමසිමක් කරන්න.

(ලකුණු 06)

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

(මුළු ලකුණු 20)

II - පත්‍රය

සැලකිය යුතුයි:

- **පළමුවැනි ප්‍රශ්නය ද 02, 03, 04, 05 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකක් ද ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න. II පත්‍රයට අදාළ පිළිතුරු සපයා වෙනම භාර දෙන්න.**

(01) පහත පැදි පෙළ කියවා අසා ඇති ප්‍රකාශ උපයෝගී කරගෙන රසාස්වාදයක් ලියන්න. (පිළිතුරට වචන 150 ත් තිබිය යුතුයි.)

රිදියෙන් තනලා රත්රන් ඔබලා
කැරලි කෙටුවයි දැකැත්තේ
සුරතට රන්වන් රැලි නංවා ලා
කදිමට දිලිසෙයි දැකැත්තේ
අඩියෙන් අඩියට තාල කියන්නට
සබයෙන් අවසර ලැබගන්නේ
සතරවරම් දෙවියන්ගේ බලයෙන්
ගොයම් කපමු අපි දැකත්තේ

ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
දුක් දෙන අලි ඇතුන් පන්නා හරින්නේ
රැක්මෙන් දෙවියනේ වෙල බත් බුදින්නේ
දුප්පත්කම නිසයි මම පැල් රකින්නේ

බෝඹු ඉදල දලු දෝ නො ලා දෝ
කෙකටිය මලේ වක යා දෝ නො යා දෝ
කැලණි ගඟේ ඔරු යා දෝ නො යා දෝ
කළුගෙ නගා මෙහි ඒ දෝ නො ඒ දෝ

කන්ද උඩින් එන කිකිළිය ගෝමරියේ
නළල් වටින් එන දාඩිය මුතු කැටියේ
අත පාමුදු පය පාමුදු වයිරොඩියේ
මට පිටුපා ගෙට යනවද සුරතලියේ

Past Papers Wiki

අල්ලා ගෙන නෙරිය අතකින් කිම් ද නගෝ
වසාගෙන දෙතන අතකින් කිම් ද නගෝ
හිමියෙක් නැතිගමන් තනි මඟ කිම් ද නගෝ
අම්බලමේ ඉඳලා අපි යම් ද නගෝ

(i) ජන කවියට පාදක වන අත්දැකීම්වල විවිධත්වය

(ii) පද්‍ය නිර්මාණයේ දී කවියා යොදා ගෙන තිබෙන කාව්‍ය උපක්‍රම

(iii) යොදා ගෙන ඇති භාෂාව

(iv) ජන කවියෙහි අව්‍යාජ ලක්ෂණ

(v) මෙම කවි පෙළෙහි ඇතුළත් ධ්වනිතාර්ථ

(ලකුණු 06 × 5 = 30 යි)

(02) විවිධ මිනිස් දුර්වලතා හාස්‍යය, උපහාසය මතු කෙරෙන ආකාරයෙන් ඉදිරිපත් කිරීමට සුභාෂිත කතුවරයා දක්වා ඇත්තේ මහත් වූ දක්ෂතාවයකි.'' නියමිත පද්‍ය තුනක් ඇසුරෙන් මේ කියමන විමසන්න.

(ලකුණු 15 යි)

(03) අලගියවන්න මුකවෙටිතුමා උපදේශ පැහැදිලි කිරීම සඳහා සත්ත්ව චරිත හා ඒවායේ ක්‍රියාකාරකම් යොදා ගෙන ඇති අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

(04) ජීවන වෘත්තීන් හා බැඳුණු අත්දැකීම් ජනකවියට වස්තු විෂය වී ඇති ආකාරය නිදසුන් සහිතව විමසන්න. (ලකුණු 15 යි)

(05) 'ජී. බී. සේනානායකයන් ළමා මනසට ගෝචර ලෙස භාෂාව හසුරුවා ඇති අයුරු වෙසක් පහන කෙටිකතාව තුළින් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

පිළිතුරු පත්‍රය - I කොටස

01) (i) (අ) කුද (ආ) ප්‍රභාවති

(ii) (අ) තඹුරු වනය මුකුලිත වන බව සවස
කවුරු විසින් වැළකිය හැකි මෙදිය කුස

(ආ) සීතාවක යුගය

(iii) (අ) කුස රජතුමා (ආ) සීලවති දේවියට

(iv) (අ) වෙසක් පහන (ආ) ජී. බී. සේනානායක

(v) (අ) ගොයම් නෙළීමේ ජන කවියකි.

(ආ) දියට දියක් නැත මෙහෙම දියක් නැත කැළණි ගඟේ දියවර වාගේ
කෙතට කෙතක් නැත මෙහෙම කෙතක් නැත ගොයම් නෙළන මේ කෙත වාගේ

02) (i) ඇත් හලේ දී ඇත් ඉලත්තියකින් ගැසීම
අස්සලේදි අස් බෙටියෙනුත් ගැසීම
ඇතුන්ගේ පශ්චිම ආසනයේ සිට මා වෙහෙසීම (ල. 05)

(ii) "මූ යන්නට අවසර නොලද්දු නම් ළය පැලී මිය යන්නාහ." (ල. 05)

(iii) චිත්ත රූප මැවෙන අවස්ථාවන් දෙකක් ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ල. 05)

(iv) සංවාදශීලි භාෂාව, චිත්ත රූප මැවෙන භාෂාව. කෙටි වාක්‍ය, දිගු වාක්‍ය (ල. 10)

<u>නැතහොත්,</u>

(i) තම උපන් ගමේ බලය, උරුමය රැක ගැනීම, අපේ රට අපේ ජාතිය රැක ගැනීම (ල. 05)

(ii) ලොකු නිලධාරින්ට

(iii) සමගිය
සමගියෙන් අපේ උරුමය රැක ගැනීමට යොමු විය යුතු බව (ල. 05)

(iv) විධි ක්‍රියා, අනුප්‍රාසාත්මක භාෂාව, සරල භාෂාව (ල. 10)

පිළිතුරු පත්‍රය - II කොටස

සපයා ඇති පිළිතුරුවල අදාළත්වය හා ප්‍රමාණත්වය පිළිබඳ සලකා සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank